**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2014**

**-----------------------------------------------------------**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

--------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

--------------------------

මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අදාළ වර්ෂයෙහි ප්‍රාග්ධන ප්‍රදානවල සම්පූර්ණ උපයෝජනයම සමුච්චිත අරමුදලට මාරු කරනු ලබන නමුත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව එම ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තොග සමීක්ෂණ වාර්තාවට අනුව අලෙවිහලේ 2014 දෙසැම්බර් 31 දිනට පැවති වටිනාකම රු.2,542,351 ක්වූ තොගය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ආ) පරිත්‍යාග ලේඛනගත කිරීමේ හා ගිණුම් තැබීමේ ප්‍රතිපත්තියක් හඳුනානොගැනීම හේතුවෙන් 2014 වර්ෂයේ දී විවිධ ව්‍යාපෘති, ආයතන හා පුද්ගලික අංශය වෙතින් පරිත්‍යාග ලෙස මණ්ඩලය වෙත ලැබී තිබුණු ප්‍රකාශන 13,623 ක් අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ආපදා ණය ශේෂය රු.13,156,972 ක් වූ අතර ආපදා ණය ලේඛනය අනුව එම ශේෂය රු.13,188,849 ක් වූයෙන් රු.31,877 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පුස්තකාල උපකරණ සහ කාර්යාල ලීබඩු හා උපකරණ ශේෂය වූ රු.25,999,058 තුල හඳුනා නොගත් රු.1,306,631 ක වත්කම් ඇතුලත්ව තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 සහ 2013 වසරවලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණු වටිනාකම රු.139,844 ක් වූ අත්තිකාරම් ශේෂය හඳුනාගෙන පියවීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1990 හා 1991 වර්ෂ සඳහා හිඟ විගණන ගාස්තු සහ 2010 වර්ෂයට අදාළ විගණන ගාස්තු වටිනාකම වූ එකතුව රු.701,110 ක් නිරවුල් කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත් කරුවන්ගෙන් අයකර දේශීය ආදායම් කොමසාරිස්ට ප්‍රේෂණය කළ යුතු වර්ෂ 3 සිට වර්ෂ 10 දක්වා පැරණි රු.89,150 ක් වූ රඳවා ගැනීම් බදු මුදල් 2018 ජනවාරි 09 විගණිත දිනය දක්වාත් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

## 2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2009 සැප්තැම්බර් 01 දින හා අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ජාතික පුස්තකාල පොත් තොගය සම්බන්ධයෙන් 1976 සිට 2014 වර්ෂය දක්වා වසර 36 කින් තොග සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට මෙම තොගයේ අගය රු.35,618,611 ක් විය. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,383,674 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.13,747,104 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.12,363,430 ක ඌනතාවයේ අඩුවීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු වියදම් රු. 12,578,470 කින් වැඩි වුවද, රාජ්‍ය ප්‍රදාන රු 23,235,000 කින් වැඩිවීම, ඉහත ඌනතාවයේ අඩුවීමට මූලික වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී දිගින් දිගටම ඌනතාවයක් ඇති වී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු 2010 වර්ෂයේ රු.3,484,240 ක් වූ දායකත්වය 2014 වර්ෂය වන විට රු.10,459,097 තෙක් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආදායම් උපයාගනු ලබන කාර්යයන්හි උපයා ගැනීමට අපේක්ෂිත ආදායම් ඇස්තමේන්තු නොකිරීමත්, බොහෝ කාර්යයන්හි ඉපයූ ආදායම වාර්තා කර නොතිබීමත් නිසා ආදායම් ඉපයීමේ ප්‍රගතිය මැනීමට නොහැකි විය. උදාහරණ ලෙස කාර්යයන් 7 කට අදාළව ඉපයීම රු.4,638,501 ක් වූ නමුත් මේ සම්බන්ධයෙන් පුරෝකතනයන් සිදුකර නොතිබුණි.

(ආ) වෙළුම් හතරකින් හා ප්‍රස්තාවනාවකින් යුතු පන්සියපනස් ජාතක පොත නැවත මුද්‍රණය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට පවරා තිබූ නමුත් එම කටයුතු සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් නැවත මුද්‍රණ කටයුතු මණ්ඩලය විසින් සිදුකිරීමට 2015 වර්ෂයේදී අනුමැතිය ලබාගෙන තිබුණු අතර පොත් 5 න් ප්‍රස්ථාවනාව සහ වෙළුම් 2ක් 2017 වසර තුළ නිමකර තිබුණි. III හා IV වෙළුම් 2 ක 2018 ජනවාරි 9 විගණිත දිනය දක්වාත් නිමකර නොතිබුණි.

(ඇ) 1850 වර්ෂයට පෙර සහ 1850 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා ප්‍රකාශනයට පත්ව ඇති පැරණි සාහිත්‍ය ග්‍රන්ථ නාමයන් එයට අදාලව ප්‍රකාශයට පත්ව ඇති සංස්කරණයන් ඇතුළත් කරමින් සාධිකාරී සිංහල ග්‍රන්ථනාම ලේඛනය සම්පාදනය කිරීමේ කටයුතු 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සැලසුම්කර තිබූ නමුත් 2018 ජනවාරි 09 විගණිත දිනය දක්වාත් සම්පාදන කටයුතු නිමකර නොතිබුණි.

(ඈ) සම්භාව්‍ය කෘති නැවත මුද්‍රණය යටතේ බුත්සරණ ග්‍රන්ථය සංස්කරණය කිරීමට 2009 අප්‍රේල් 23 දින කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශය වෙත භාරදී තිබූ නමුත් සංස්කරණ කටයුතු නිමකළ යුතු දිනයක් පිළිබඳ සේවාදායක ආයතනය සමඟ එකඟතාවයකට පැමිණ නොතිබුණි. සංස්කරණ කටයුතු නිමකර 2012 අගෝස්තු 13 දින මණ්ඩලය වෙත භාරදී තිබුණි. පසුව අක්ෂර සංයෝජන කටයුතු සිදුකර මුද්‍රණය කිරීම සඳහා 2013 දෙසැම්බර් 02 දින අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබූ අතර දෙපාර්තමේන්තුව විසින් අක්ෂර සංයෝජන කටයුතු සිදුකර නැවත මණ්ඩලය විසින් සෝදුපත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව මුද්‍රණායතනයක් වෙත මුද්‍රණ කටයුතු සඳහා දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේදී භාරදී තිබුණද 2018 ජනවාරි 09 දිනැති විගණිත දිනය දක්වාත් කටයුතු නිමකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අලෙවියෙන් පසුව මුදල් ගෙවීමේ පදනම මත කතෘවරුන්ගෙන් ලබා ගත් පොත් අලෙවිය සම්බන්ධයෙන් අංශභාර අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ-පුස්තකාල ප්‍රවර්ධන ප්‍රමිතිකරණ සහ මණ්ඩලයේ සභාපතිවරයා විසින් විටින් විට මිල වෙනස් කිරීම් කර තිබූ අතර කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද ස්ථිර මිල ප්‍රතිපත්තියක් මණ්ඩලය විසින් හඳුන්වා දී නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් 2011 වර්ෂයේ සිට මුද්‍රණය කරනු ලැබූ රු. 413,897 ක් වටිනා මණ්ඩලීය ප්‍රකාශන 3,813 ක තොගයක් සහ වටිනාකම සඳහන් නොවන ඒකක 7,255 ක තොගයක් 2014 දෙසැම්බර් 31 දින වනවිටද ගබඩාවේ සහ ග්‍රන්ථ විඥාපන පාලන අංශය තුළ ඉතිරිවී තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිදුකරන ලද තොග සමීක්ෂණයේ දී පාඨක සේවා අංශය තුළ පොත් 7,917 ක අඩුවක් පවතින බව සමීක්ෂණ මණ්ඩලය විසින් සොයාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් ආයතනය කරන ලද පරීක්ෂාවන් තුළින් පොත් 2,908 ක් සොයාගත තිබූ නමුත්, තවදුරටත් පැවති පොත් 5,009 ක ඌනතාවය සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) දේශීය හා විදේශීය විවිධ පොත් පරිත්‍යාගශීලී ආයතන හා පුද්ගලයින් විසින් මණ්ඩලයට පරිත්‍යාග කරනු ලබන පොත් පරිත්‍යාග භාරගැනීම සඳහා මණ්ඩලයෙහි වෙනම ව්‍යාපෘතියක් නොතිබුණු අතර මෙම ප්‍රකාශන විධිමත් පරිදි ලේඛනගත කර හෝ එම වත්කම් වල ආරක්ෂාව පිළිබඳව ආරක්ෂිත වැඩ පිළිවෙලක් ඇතිකර නොතිබුණි.

**4.3 අරමුදල් ඌණ උපයෝජණය**

---

ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව නියමිත කාලය තුළදී මිලදීගැනීම් සිදු නොකිරීම හේතුවෙන් ඒ සඳහා ලබාදෙන ලද ප්‍රාග්ධන ප්‍රදාන සම්පූර්ණ වශයෙන් උපයෝජනය නොවීම නිසා 2014 ජනවාරි 01 දිනට රු. 8,715,000 ක් වූ උපයෝජනය නොකරන ලද ශේෂය 2014 දෙසැම්බර් 31 දිනට රු.12,972,000 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රෙල්ඛයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ අවුරුදු 2 මාස 6 ක ප්‍රමාදයකින් පසුව 2017 අගෝස්තු 31 දිනදීය.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

---

2014 ජනවාරි 28 දින කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2014 වර්ෂය සඳහා වූ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් පරිදි අදාළ කරුණු ඇතුළත් කර යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් විය යුතු ආයතනයේ සංවිධාන ව්‍යුහය, සමස්ථ ආදායම් හා වියදම් ඇතුළත් අයවැය ලේඛනය සහ ප්‍රසම්පාදනයන් සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් වී නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

---

2009 ජූනි 09 දිනැති විගණන හා කළමනාකරණ චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/ 2009 (1) හා 1998 පෙබරවාරි 13 දිනැති අංක 98/1 දරන කළමනාකරණ දෙපාර්තමේන්තු විගණන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය තුළ ඉටුකරන ලද වැඩ පිළිබඳ වාර්තා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හා විගණකාධිපති වෙත පිටපත් සහිතව අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

---

අයවැයගත හා තත්‍ය ආදායම් වියදම් අතර සියයට 25 සිට සියයට 100 ක් අතර පරාසයක් තුළ සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

---

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම. |
| | | (ii) | පොත් පරිත්‍යාග ලේඛනගත නොකිරීම. |
| (ආ) | ගිණුම්කරණය | (i) | ලෙජර ගිණුම් යාවත්කාලීනව පවත්වාගෙන නොයාම හා ගබඩාතොග පාලන ලෙජරය පවත්වාගෙන නොයාම . |
| | | (ii) | අවලංගුකළ චෙක්පත් ලේඛනයක් පවත්වාගෙන නොයාම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | (i) | සැලසුම් අනුව ප්‍රසම්පාදන කටයුතු නොකිරීම. |
| | | (ii) | කොන්ත්‍රාත් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබීම. |
| (ඈ) | අත්තිකාරම් පාලනය | (i) | අත්තිකාරම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| | | (ii) | අත්තිකාරම් මුදල් පියවීමේ වවුචර් සහතික කර ලේඛනගත කිරීම ප්‍රමාද වීම. |